සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 34 S I

විද්‍යාව | කාලය පැය දෙකයි

I කොටස

● සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ජීවී හා අජීවී ද්‍රව්‍ය පිළිවෙලින් දක්වෙන්නේ කවර පිළිතුරේද?
 01. දළඹුවා - මකුළුවා  02. සමනලයා - ගිනිමැලය  03. පිදුරු - පොකුණු ජලය  04. මී වදය - මී මැස්සා

02. කොළ පැහැතිය, ස්වයංපෝෂී වේ, ස්වසනය කරයි, වර්ධනය වේ, වර්ගයා බෝ කරයි. ඉහත ලක්ෂණ සියල්ල අයත් ජීවියා වන්නේ,
 01. තණකොළ පෙත්තා  02. ගොයම් මැස්සා  03. ගොයම් ගස  04. ගිරවා


03. කාබන්ඩයොක්සයිඩ් වායුව,
 01. ජීවීන්ගේ ශ්වසනයට අවශ්‍යයි.
 02. ද්‍රව්‍ය දහනයට අවශ්‍යයි.
 03. අවර්ණ හුණු දියර කිරි පැහැ ගන්වයි.
 04. ජීවීන්ගේ ස්වසනයට හා ද්‍රව්‍ය දහනයට අවශයයි.

04. සර්වභක්ෂක සතුන් පමණක් සහිත පිළිතුර තෝරන්න.
 01. නයා, ගෙම්බා, රිලවා
 02. කපුටා, කුකුළා, වලහා
 03. කපුටා, මිනිසා, දිවියා
 04. නරියා, ගිරවා, පොළගා


05. පැන්ඩා යන සත්ත්වයා වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇත්තේ,
 01. චීනයේ පමණක් ජීවත් වන නිසා
 02. පැටවුන් බෝ වීමේ වේගය අඩු නිසා
 03. සුරතල් පෙනුම හේතු කොටගෙන මිනිස් ග්‍රහණයට හසු වීම නිසා
 04. එකම ශාක ද්‍රව්‍යයක් මත පමණක් යැපීම නිසා

06. පොසිල ඉන්ධන වල අඩංගු වන්නේ,
 01. තාප ශක්තියයි  02. ධ්වනි ශක්තියයි  03. සූර්යය ශක්තියයි  04. සුළං ශක්තියයි.

07. වර්ෂාවකදී පොළොවට පතිතවන ජලයේ හැසිරීම නිරීක්ෂණය කිරීම සඳහා සකස් කළ ඇටවුමක් පහත දක්වේ. මෙහි A,B,C සමාන කළ හැක්කේ පිළිවෙලින්,





 01. වර්ෂණය, මතුපිට ජලය, භූගත ජලයටයි.
 02. මතුපිට ජලය, වර්ෂණය, භූගත ජලයටයි.
 03. භූගත ජලය, වර්ෂණය, මතුපිට ජලයටයි.
 04. භූගත ජලය, මතුපිට ජලය, වර්ෂණයයි.




08. සර්ව සම බඳුන් තුනකට කරදිය, මිරිදිය හා කිවුල්දිය සමාන පරිමා වලින් දමා අව්වේ තබන ලදි. ජලය සම්පූර්ණයෙන් සිඳී ගිය පසු A හි කිසිවක් දක්නට නොලැබුණි. B හි සණකම සුදු පැහැ කුඩක්ද, C හි ඉතා තුනී සුදු කුඩු ස්ථරයක්ද දැකගත හැකි විය. A,B,C විය හැක්කේ පිළිවෙලින්,
 01. කරදිය, කිවුල්දිය හා මිරිදිය
 02. මිරිදිය, කරදිය හා කිවුල්දිය
 03. මිරිදිය, කිවුල්දිය හා කරදිය
 04. කිවුල් දිය, කරදිය හා මිරිදිය

09. රූපයේ දක්වා ඇති සංගීත භාණ්ඩය වන්නේ,



 01. සෙක්සෆෝනයයි
 02. ට්‍රම්පටයයි
 03. වයලීනයයි
 04. සයිලෆෝනයයි

10. ගොක්කොළ නලාවකින් ශබ්දය ඇති කරන ආකාරය මෙන් ශබ්දය ඇතිවන සංගීත භාණ්ඩය,
 01. සර්පිනාව  02. ගිටාරය  03. සිතාරය  04. දවුල




LIVEWORKSHEETS

11. ඝණ, ද්‍රව, වායු අවස්ථා තුනෙහිම දැකිය හැකි පදාර්ථ යුගල වන්නේ,

01. පොල්තෙල් හා විනාකිරි
02. ජලය හා ඉටි
03. විනාකිරි හා ජලය
04. ඉටි හා විනාකිරි


12. නිදහසේ එල්ලන ලද චුම්බක දෙකක් එකිනෙකට ළංකල අවස්ථා තුනක් A,B,C ලෙස දැක්වේ.




A,B,C හි දැකිය හැකි නිරීක්ෂණ වන්නේ පිළිවෙළින්,

01. විකර්ෂණය, විකර්ෂණය, ආකර්ෂණය
02. ආකර්ෂණය, විකර්ෂණය, විකර්ෂණය
03. ආකර්ෂණය, ආකර්ෂණය, විකර්ෂණය
04. විකර්ෂණය, ආකර්ෂණය හා විකර්ෂණය



13. ජෝගුවේ තිබූ ජලය සම්පූර්ණයෙන්ම වීදුරුවට වත්කළ පසු,





01. ජලයේ හැඩය වෙනස් වේ.
02. ජලයේ පරිමාව වෙනස් වේ.
03. ජලයේ ස්කන්ධය වෙනස් වේ.
04. ජලයේ පවතින අවස්ථාව වෙනස් වේ.

14. ඩයෝඩයක සම්මත සංකේතය වනුයේ,

01. 

02. 
03. 
04. 

15.





ඉහත කුමන් අවස්ථාවේ බල්බය නොදැල්වේ ද?

01. A
02. B
03. C
04. D

16. තාපය හේතු කොට ඇතිවන වර්ණ විපර්යාසයකි.


01. රත් කරන විට යකඩ කැබැල්ලක පැහැය වෙනස් වීම.
02. ගස්වල පත්‍ර කහ පැහැයට හැරීම.
03. මුහුදේ ජලය නිල්පාට වීම.
04. අව්වේ සිටින විට සම කළු වීම.

17. කුඩා ලෝහ ගෝලයක් රූපයේ දැක්වෙන පරිදි කම්බියකින් එල්ලා ඇත. කම්බිය ටික වේලාවක් රත් කරන විට ලෝහ ගෝලය පොළොව හා ස්පර්ශ විය. මීට හේතුව වන්නේ,




01. රත් කිරීම නිසා ලෝහ ගෝලය බරින් වැඩි වීම
02. තාපය නිසා ලෝහ ගෝලය පහලට තල්ලු වීම.
03. තාපය නිසා කම්බිය ප්‍රසාරණය වී දිගින් වැඩිවීම.
04. තාපය නිසා ලෝහ ගෝලය ප්‍රසාරණය වීම.

18. A,B හා C උපකරණ වන්නේ පිළිවෙළින්,




01. වර්ෂාමානය, සුළං දිශා දර්ශකය, අනිලමානය
02. වර්ෂාමානය, අනිලමානය, සුළං දිශා දර්ශකය
03. සුළං දිශා දර්ශකය, අනිලමානය, වර්ෂාමානය
04. අනිලමානය, වර්ෂාමානය, සුළං දිශා දර්ශකය

19. තෙත් කලාපයට අයත් නොවන ප්‍රදේශයක් වන්නේ,

01. රත්නපුර
02. ගම්පහ
03. හැටන්
04. අම්පාර

20. විදුලි පරිපථ හා උපාංග ජලය ඇති ස්ථාන වල භාවිතා නොකළ යුත්තේ,

01. ලිස්සා වැටී අනතුරු ඇතිවිය හැකි නිසා
02. ජලය තුළින් විදුලිය සන්නයනය වී අනතුරු ඇතිවන නිසා
03. ජලය ඇතිවිට පරිපථ අක්‍රිය වන නිසා
04. විදුලි උපාංග මළ කෑමට ලක්වන නිසා



LIVEWORKSHEETS